11

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# බස්නාහිර පළාතේ
# පළාත් සභාව

(සෞඛ්‍ය සහ ආර්ථික උප ව්‍යුහයන් පිළිබඳ අමාත්‍යාංශය)

## 1990 අංක 01 දරන බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා
## ප්‍රඥප්තිය

**(බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතය සටහන් කළේ 1990. 01. 22 දින දීය)**

බස්නාහිර පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

**බස්නාහිර පළාතේ පළාත් සභාවේ සෞඛ්‍ය සහ ආර්ථික උප ව්‍යුහයන් පිළිබඳ අමාත්‍යාංශයෙන් මිලදී ගත හැක.**

මිල: රු. 10. 00 — තැපැල් ගාස්තුව: රු. 2. 50

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# බස්නාහිර පළාතේ
# පළාත් සභාව

(සෞඛ්‍ය සහ ආර්ථික උප ව්‍යුහයන් පිළිබඳ අමාත්‍යාංශය)

## 1990 අංක: 01 දරන බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය

මෙහි අංක: 01 සිට 12 දක්වා ඡේදයන් ඇතුලත් වන 1990 අංක: 01 බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය නම් වූ මෙම ප්‍රඥප්තිය 1990. 01. 17 දින පවත්වන ලද බස්නාහිර පළාත් සභා රැස්වීමේ දී සභා සම්මත වූ බව සහතික කරමි.

සභාපති
බස්නාහිර පළාත් සභාව

# බස්නාහිර පළාතේ පළාත් සභාව
# මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය

පළාත ඇතුළත මූලාරම්භය ඇත්තාවූ මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා විධිමත් කිරීම පිණිස සහ එවැනි සේවා සැපයීමේ ව්‍යාපාරයෙහි නියුක්ත වීමට පළාත් සභාවට හැකිවනු පිණිස පනවන ලද ප්‍රඥප්තියකි. මේ ප්‍රඥප්තිය 1983 අංක 44 දරන පෞද්ගලික බස් රථ සේවා පනතට සහ සංශෝධිත පරිදි වූ (203 වන අධිකාරය වූ) මෝටර් ප්‍රවාහන පනතට අනනුකූල වූවකි.

බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය**

1. මේ ප්‍රඥප්තිය 1990 අංක 01 දරන බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේය.

**ප්‍රඥප්තිය යටතේ පරිපාලනය**

2. (1) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා (මෙහි මින් මතු ''පළාත් අධ්‍යක්ෂවරයා'') යනුවෙන් සඳහන් කරනු ලබන බස් රථ ප්‍රවාහන කටයුතු පිළිබඳ පළාත් අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබිය යුතුය. මේ ප්‍රඥප්තිය යටතේ සාමාන්‍ය පරිපාලනය ඔහුට භාරවන අතර මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හෝ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය වන, බස්රථ ප්‍රවාහනය පිළිබඳ පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සහ වෙනත් නිලධරයන් අවශ්‍ය සංඛ්‍යාවක්, පත් කරනු ලැබිය හැකිය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ පළාත් අධ්‍යක්ෂවරයාගේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය යම් පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු විසින් හෝ පළාත් අධ්‍යක්ෂවරයාගේ අත්සන යටතේ ලිඛිතව බලය පවරනු ලැබූ වෙනත් යම් නිළධරයකු විසින් පාවිච්චි කරනු ලැබිය හැකිය. ඉටු කරනු ලැබිය හැකිය. සිදුකරනු ලැබිය හැකිය.

**නිතිපතා සේවා සඳහා මගී ප්‍රවාහන අවසර පත්‍ර**

3. (1) ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව විසින් පනවන ලද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි වූ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් නොවන වෙනත් කිසිදු තැනැත්තකු විසින්, මෙහි 2 වන උප වගන්තියට යටත්වද මේ ප්‍රඥප්තිය යටතේ පළාත් අධ්‍යක්ෂවරයා විසින් ප්‍රදානය කරන ලද තත්කාලයේ වලංගුව බල පවත්නා බලපත්‍රයක බලය යටතේ ද හැර, ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා මගීන් ප්‍රවාහනය කිරීම පිණිස පළාත තුළ මූලාරම්භවන නිතිපතා සේවයේ යොදවනු ලබන බස් රථයක් මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමේ දිනයේදී හෝ ඉන්පසු පළාත තුළ ධාවනය නොකර විය යුතුය.

(2) 1985 අංක 38 දරන පෞද්ගලික බස් රථ සේවා (සංශෝධිත) පනත මගින් සංශෝධිත 1983 අංක 44 දරන පෞද්ගලික බස්රථ සේවා පනත යටතේ නිකුත් කරන ලද්දවූද පළාත තුළ

ආරම්භය ඇති මාර්ගයක් සම්බන්ධයෙන් වූද මගී ප්‍රවාහන සේවා අවසර පත්‍රයක්, මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ මගී ප්‍රවාහන අවසර පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු අතර මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට එම බලපත්‍රය නිකුත් කළ කාලය සඳහා හෝ මාස 6 ක කාලයක් සඳහා හෝ මේ දෙකින් අඩු කාලය සඳහා වලංගු වන්නේය.

(3) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේදී හෝ ඉන්පසු, ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීම පිණිස නිතිපතා සේවයට බස් රථයක් හැර වෙනත් වාහනයක් කිසිදු තැනැත්තකු විසින් පාවිච්චි නොකළ යුතුය.

(4) මේ වගන්තියේ විධිවිධාන උල්ලංඝණය කරමින් පාවිච්චි කරනු ලබන යම් වාහනයක් 2 (2) වන වගන්තිය යටතේ බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ යම් පොලිස් නිලධරයකු විසින් තහනමට අල්ලාගනු ලැබිය හැකි අතර, එසේ තහනමට අල්ලා ගනු ලැබුවේ කවර මහේස්ත්‍රාත් අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළදී ද ඒ අධිකරණය වෙත අනිසි ප්‍රමාදයකින් තොරව ඒ වාහනය ඉදිරිපත් කළ යුතුය.

(5) යම් වාහනයක් (4) වන උප වගන්තියේ විධිවිධාන යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබූ විට නඩු විභාගය අවසාන වනතුරු ඒ වාහනය රඳවා තබා ගැනීමට හෝ අවස්ථානුරූපව මහේස්ත්‍රාත්වරයා විසින් පනවනු ලබන කොන්දේසි වලට යටත්ව ඒ වාහනය මුදා හැරීමට ඒ මහේස්ත්‍රාත්වරයා විසින් ආඥා කරනු ලැබිය හැකිය.

ඒකාබද්ධ කිරීමේ වගන්තිය

4. (1) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පනවන ලද 1985 අංක 38 දරන පෞද්ගලික බස් රථ සේවා (සංශෝධිත) පනතින් සංශෝධිත හෝ ඇතුළත් කරනු ලැබූ 1983 අංක 44 දරන පෞද්ගලික බස්රථ සේවා පනතේ 4 සිට 32 දක්වා වූ (ඒ වගන්ති දෙකම ඇතුළුව) වගන්තිවල සහ 35 වගන්තියේ විධිවිධාන, එකී වගන්තිවල ''පනත'' යන වචනය යෙදී ඇති කවර වූවද තැනක ඒ වෙනුවට ''ප්‍රඥප්තිය'' යන වචනය ආදේශ කිරීමට යටත්ව, මේ ප්‍රඥප්තියෙහි ඒකාබද්ධ කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒවා මේ ප්‍රඥප්තියෙහි කොටසක් වන්නේය. තවද එකී වගන්ති අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, පළාත තුළ මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා විධිමත් කිරීම සඳහා අදාල වන්නේය.

(2) මෙහි 1 වන තීරයේ දක්වෙන යම් නිලධරයෙකුට, ස්ථානයකට, ආයතනයකට හෝ වෙනත් දේකට අදලව 1 වන උප වගන්තියේ සඳහන් විධිවිධාන වල ඇතුළත් වන යම් සඳහනක් මෙහි 2 වන තීරයේ තදනුරූපව දක්වා ඇති නිලධරයෙකුට, ස්ථානයකට, ආයතනයකට හෝ වෙනත් දේකට කරනු ලැබූ සඳහනක් සේ සලකනු ලැබිය යුතුය:-

| 1 වන තීරය | 2 වන තීරය |
|---|---|
| අමාත්‍යවරයා | ප්‍රවාහන විෂය භාර පළාත් අමාත්‍යවරයා |
| අධ්‍යක්ෂවරයා | පළාත් අධ්‍යක්ෂවරයා |
| සම්මේලනය | පළාත් සම්මේලනය |
| අධ්‍යක්ෂවරුන් | පළාත් අධ්‍යක්ෂවරුන් |
| රජයේ නිලධරයන් | පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් |
| මේ පනත | මේ ප්‍රඥප්තිය |

**ආදායම් බල පත්‍ර ලබා ගැනීම**

5. සංශෝධිත පරිදි වූ මෝටර් ප්‍රවාහන පනතේ 28 වන වගන්තියේ මීට පටහැනිව කුමක් සඳහන්ව තිබුණද, මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද නිතිපතා ධාවනය කරන සේවයක් සඳහා මගී ප්‍රවාහන අවසර පත්‍රයක් දරන්නකු විසින් බස්රථ සඳහා වූ බල පත්‍රයක් ලබාගත හැකිය.

**203 වන අධිකාරය වූ මෝටර් ප්‍රවාහන පනතේ 46 වන වගන්තියට අදාල නොවන බව**

6. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පනවන ලද 1983 අංක 44 දරන පෞද්ගලික බස් රථ සේවා පනත මගීන් සංශෝධිත මෝටර් ප්‍රවාහන පනතේ 46 වන වගන්තියේ මීට පටහැනිව කුමක් සඳහන් වූවද, මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ මගී ප්‍රවාහන බල පත්‍රයක වලංගු යටතේ පළාත තුළ කවර වූවද මහා මාර්ගයක බස් රථයක් ධාවනය කරනු ලැබිය හැකිය.

**සංශෝධිත පරිදි වූ පෞද්ගලික බස් සේවා පනත පළාත තුළ අදාළ නොවන බව**

7. මේ ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ කාර්ය සඳහා හැර, කලින්කල සංශෝධිත 1983 අංක 44 දරන පෞද්ගලික බස් රථ සේවා පනතේ විධිවිධාන, පළාත තුළ මූලාරම්භය ඇති මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ යම් සේවයක් පළාත තුළ විධිමත් කිරීම සඳහා ක්‍රියාත්මක වීම, නැවතිය යුතුය.

**මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා සඳහා සමාගමික මුදල් ආයෝජනය කිරීම**

8. 1982 අංක 17 දරන ශ්‍රී ලංකා සමාගම් පනත යටතේ සංස්ථාපිත කරන ලද සහ මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ ව්‍යාපාරය පළාත තුළ පවත්වාගෙන යන හෝ පවත්වාගෙන යැමෙහි නිරතව සිටින හෝ පවත්වාගෙන යැම සූදනම් වන හෝ නියුක්ත වීමට සූදනම් වන යම් පොදු සමාගමක කොටස්වල හෝ ස්කන්ධවල මුදල් ආයෝජනය කිරීම හෝ එවැනි කොටස් නැතහොත් ස්කන්ධ අත්කර ගැනීම හෝ දැරීම පළාත් සභාව විසින් කරනු ලැබිය හැකිය.

එසේ වූවද, එවැනි සමාගමක් පාලනය කිරීමේ හැකියාව පළාත් සභාවට ලැබෙන පරිදි ඒ සමාගමේ කොටස් වලින් හෝ ස්කන්ධ වලින් සියයට 51 කට නොඅඩු කොටස් හෝ ස්කන්ධ ප්‍රමාණයක් පළාත් සභාව විසින් අත්කර ගනු ලබන්නේ නම් මිස, එවැනි ආයෝජනය කිරීමක් හෝ කොටස් නැතහොත් ස්කන්ධ අත්කර ගැනීමක් හෝ දැරීමක් පළාත් සභාව විසින් නොකළ යුතු අතර එවැන්නකට ඇතුළත් නොවිය යුතුය.

**ආයෝජනය කිරීම සඳහා පළාත් සභාවේ අනුමැතිය ලබාගැනීම**

9. කොටස්වල මුදල් ආයෝජනය කිරීමට හෝ අත්කර ගැනීමට පෙර අමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යවරයා විමසා,

(අ) ආයෝජනය කිරීමට අපේක්ෂා කරනු ලබන ව්‍යාපාරයේ වත්කම් සහ බැරකම් ඇතුළුව ඒ ව්‍යාපාරයේ තත්ත්වය පිළිබඳව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (8) වන ව්‍යවස්ථාවේ අර්ථ කථනය කර ඇති අන්දමේ සුදුසුකම් ලත් විගණක වරයකු විසින් පිළියෙල කරනු ලැබූ වාර්තාව සහ,

(ආ) එවැනි කොටස්වල හෝ ස්කන්ධවල මුදල් ආයෝජනය කිරීමේ හෝ ඒවා අත්කර ගැනීමේ හෝ දැරීමේ යෝජනාව.

පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කොට සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

**වෙනත් පළාත්වලට සේවා ව්‍යාප්ත කිරීම**

10. ඉහත සඳහන් සමාගමක් විසින් සපයනු ලබන සේවා, වෙනත් පළාතක පළාත් සභාවේ එකඟත්වය ඇතිව සහ මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවාවලට අදාල වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව, අන්තර් පළාත් මහා මාර්ගවල මගීන් ප්‍රවාහනය කිරීමේ සේවයන් වශයෙන් දීර්ඝ කරනු ලැබිය හැකිය.

**සමාගමේ සංස්ථා පත්‍රය සහ ව්‍යවස්ථාවලිය**

11. ඉහත සඳහන් යම් සමාගමක සංස්ථා පත්‍රයෙන් සහ ව්‍යවස්ථා වලියෙන් පහත දැක්වෙන පරිදි විධිවිධාන සැලැස්විය යුතුය.

(අ) අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරය පත් කිරීම සහ ඔවුන් ඉවත් කිරීම අමාත්‍යවරයා විසින් කරනු ලැබීමට;

(ආ) සමාගමේ බලතල පාවිච්චි කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය විධාන අමාත්‍යවරයා විසින් දෙනු ලැබීමට;

(ඇ) අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව සාංගමික සංස්ථා පත්‍රය සහ ව්‍යවස්ථාවලිය සංශෝධනය නොකළ යුතු බවට;

(ඇ) සමාගමේ පරමාර්ථ විය යුත්තේ උපරිම ජනතා සේවයක් ලබා දෙමින් කාර්යක්ෂමවූත් වාසිදයකවූත්, මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවාවන් අන්තර් පළාත් වශයෙන් දීර්ඝ කිරීමට ද ඉඩ ඇතිව පළාත තුළ පවත්වාගෙන යාමෙන් බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත ආදයමක් උත්පාදනය කර ගැනීමට;

අර්ථ නිරූපනය

12. මේ ප්‍රඥප්තියෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,

"අමාත්‍යවරයා" යන්නෙන් පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් අතුරෙන් ප්‍රවාහන කාර්ය භාර අමාත්‍යවරයා අදහස් වේ.

"මුදල් අමාත්‍යවරයා" යන්නෙන් පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් අතුරෙන් මුදල් පිළිබඳ කාර්ය භාර අමාත්‍යවරයා අදහස් වේ.

"බස් රථය" යන්නට මෝටර් ප්‍රවාහන පනතේ දී ඇති අර්ථයම ඇත්තේය.

"මගියා" යන්නට මෝටර් ප්‍රවාහන පනතේ දී ඇති අර්ථයම ඇත්තේය.